www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# දිගු කාලීන ශ්‍රී ලාංකික ට්‍රොට්ස්කිවාදියා මිය යයි වේලුපිල්ලෙයි සරවනපෙරුමාල් (1948-2005)

## Longstanding Sri Lankan Trotskyist dies Velupillai Sarawanaperumal (1948-2005)

**කේ. රත්නායක විසිනි**
**2005 අප්‍රේල් 20**

ඔහුගේ සහෝදරවරුන් හා මිතුරන් පාපා යන ආදරනීය නාමයෙන් දන සිටි, සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජික වේලුපිල්ලෙයි සරවනපෙරුමාල්, පෙනහලු ආබාධයක් හේතු කොටගෙන අප්‍රේල් 14 දා උදෑසන මිය ගියේ ය. යන්තම් 56 වන වියෙහි දී සිදු වූ ඔහුගේ අකල් මරනය ශ්‍රී ලංකාවේ සසපට ද ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයට ද බලවත් පාඩුවකි. ඔහු සිය බිරිඳ සරස්වතීගෙන් සහ 15 හැවිරිදි පුතු පරනිදරන්ගෙන් වියොව ගොස් ඇත.

අප්‍රේල් 15 දා යාපනයේ වන්නර්පනෙයිහි පැවති සරවනපෙරුමාල්ගේ අවමගුලට දහසක් පමන සහභාගි විය. එය වනාහි ඔහුගේ දේශපාලනික හා පුද්ගලික කීර්තිය පිලිබඳ සාක්ෂ්‍යයකි. යුද්ධයෙන් විනාශයට පත්ව ඇති රටේ උතුරු පලාතේ කරෙයිනගර්, කයිට්ස්, නෙල්ලිඅඩි, වඩුකොඩෙයි, කිලිනොච්චිය, වවුනියාව සහ යාපනය යන ප්‍රදේශවලින් මෙන් ම කොලඹින් ද ඔහුගේ සහෝදර කම්කරුවන්, පක්ෂ සාමාජිකයන් සහ ආධාරකරුවන්, පවුලේ සාමාජිකයන්, ඥාතීන් සහ මිතුරන් එහි පැමින සිටියේ හදිසි දනුම්දීමකට ප්‍රතිචාර දක්වමිනි. ඔහුගේ සේවා ස්ථානය වූ රජයට අයත් සීනෝර් සංස්ථාවේ යාපනය අසල ගුරුනගර් ශාඛාවෙන් කම්කරුවන් 80ක් පමන අවමගුලට සහභාගි විය.

සසප මධ්‍යම කාරක සභික එස්. චන්ද්‍රසේකරන්, සරවනපෙරුමාල්ගේ ජීවන හා දේශපාලන ඉතිහාසයේ අර්ථභාරය පැහැදිලි කරමින්, අවමඟුලේ දී කතා කලේ ය. "ඔහු අසීරු දේශපාලන ගැටලුවලට කෙටි මාවත් සෙවීමට උත්සාහ කලේ නැහැ. සරවනපෙරුමාල් කියන්නෙ විද්‍යාත්මක සමාජවාදය මත පදනම් වූත් දීර්ඝ අරගලයක යෙදීමට සූදානම් වූත් මිනිසෙක්. කම්කරුවන් දේශපාලනික කොට ඔවුන් වෙත සමාජවාදී දේශපාලනය ගෙන ඒමට ඔහුට අවශ්‍ය වුනා." යැයි චන්ද්‍රසේකරන් පැවසී ය.

සරවනපෙරුමාල් 1975 දී සසපයේ පූර්වගාමී සංවිධානය වූ ද හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව වූ ද විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයට බැඳුනි. ඔහු සිය දේශපාලන ඒත්තුගැනීම් කිසිදාක අත නොහැරිය අතර, අනතුරුව එලැඹි දශක තුනක කාලය මුලුල්ලේ ම අසීරු පුද්ගලික කොන්දේසි හා ඇදුම හා බ්‍රොන්කයිට්ස් රෝගී තත්වයන් නොතකා ජාත්‍යන්තර සමාජවාදී මූලධර්ම වෙනුවෙන් ක්ෂමාවිරහිතව සටන් වැදුනි. උතුරු ශ්‍රී ලංකාවේ බොහෝ දෙමල වැසියන්ගේ මෙන් ම, ඔහුගේ සෞඛ්‍ය තත්වයට ද රටේ දිග්ගැසුනු සිවිල් යුද්ධය බරපතල ලෙස බලපෑවේ ය.

සරවනපෙරුමාල් උපත ලැබුවේ, 1948 සැප්තැම්බර් 7 දා යාපනයේ සිට කිලෝ මීටර් 25ක් පමන දුරින් පිහිටි කරෙයිනගර්හි දී ය. ඔහුගේ දෙමව්පියෝ සාපේක්ෂව ධනවත් ගොවි පවුලකට අයත් වූහ. ලාබාල වියේ දී ම සරවනපෙරුමාල්ට සිය මව අහිමි විය. ඔහු කරෙයිනගර් හින්දු විද්‍යාලයේ විද්‍යා විෂය ධාරාවන්ගෙන් අපොස සාමාන්‍ය පෙල දක්වා අධ්‍යාපනය ලැබී ය. පසුව රැකියාවක් ලබා ගැනීමේ අටියෙන්, ඔහු තැපැල් මාර්ගයෙන් මැට්‍රිකියුලේෂන් පොත් තැබීමේ පාඨමාලාවක් හැදෑරූ අතර යාපනයේ කාර්මික විද්‍යාලයේ විදුලි කාර්මිකයකු ලෙස ද පුහුනු විය.

සරවනපෙරුමාල් විකොසට ආකර්ෂනය වූයේ, ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තරව වැඩෙන දේශපාලන අවුල්වියවුල්වල කාල පරිච්ඡේදයක් වූ 1970 ගනන්වල ය. ලංකා සමසමාජ පක්ෂය (ලසසප) සිය ආරම්භක ට්‍රොට්ස්කිවාදී මූලධර්ම අතහැර 1964 දී සිරිමාවෝ බන්ඩාරනායක මැතිනියගේ ධනේශ්වර ආන්ඩුවට එක්වීමට ගත් තීන්දුව දේශපාලන වාතාවරනයට ප්‍රගාඪ බලපෑමක් සිදු කලේ ය.

ලසසප කම්කරුවන් ඒකාබද්ධ කිරීමේ අරගලය ප්‍රතික්ෂේප කිරීම සෘජුව ම තුඩු දුන්නේ වර්ගෝත්තමවාදී දේශපාලනය මත පදනම් වූ මධ්‍යම පන්තික රැඩිකල් ව්‍යාපාරවල වර්ධනයට යි. දකුනේ දී, ගම්බද තරුනයෝ ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) ගරිල්ලාවාදය හා සිංහල ස්වෝත්තමවාදය වෙත හැරුනි. උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල දී, දෙමල තරුනයෝ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ පූර්වගාමීන් ඇතුලු විවිධ දෙමල

බෙදුම්වාදී සංවිධානවලට සහාය දීමට පටන් ගති.

1970-1977 දෙවන බන්ඩාරනායක සභාග ආන්ඩුව දෙමල ජනයාට එරෙහිව ගත් ක්‍රියාමාර්ග බෙදුම්වාදී මනෝගතීන් තව දුරටත් අවුලුවාලී ය. ලසසප නායක කොල්වින් ආර්. ද සිල්වා, ආන්ඩුවේ ඇමතිවරයකු ලෙස, සිංහල නිල රාජ්‍ය භාෂාව ලෙසත් බුද්ධාගම රාජ්‍ය ආගම ලෙසත් ස්ථාපිත කල නව ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමෙහි ලා වගකීම දැරී ය. දෙමල තරුනයෝ විශේෂයෙන් ම අධ්‍යාපනය හා රැකියා ක්ෂේත්‍රවල මුල් බැස තිබූ වෙනස්කම් කිරීම්වලට ප්‍රතිචාර දැක්වූ හ.

වැඩෙන වර්ගෝත්තමවාදයේ පීඩනය නොතකා ම, සරවනපෙරුමාල්, කම්කරුවන් භේද කිරීම නොව, ඔවුන් ඒකාබද්ධ කිරීම මත පදනම් වූ පන්ති ප්‍රවිෂ්ඨයකට ආකර්ෂනය විය. ඔහු ලසසප පිලිබඳ හුදු සරල රැඩිකල් හෙලාදැකීම් ප්‍රතික්ෂේප කල අතර විකොසට ආකර්ෂනය වූ වඩා දුර දිග දකින දෙමල කම්කරුවන් හා තරුනයන් අතරට එක් විය. 1968 දී පිහිටුවන ලද විකොස, මයිකල් පැබ්ලෝ සහ අර්නස්ට් මැන්ඩෙල් විසින් නායකත්වය දෙනු ලැබූ අවස්ථාවාදී ප්‍රවනතාවකට එරෙහිව හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ඇරඹූ අරගලය ලසසප විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීමෙන් පසුව සිදු වූ එහි දිග්ගැසුනු පරිහානිය තුල ලසසප පාවාදීමේ මූලයන් පවත්නා බව තහවුරු කර ගති.

1970 ගනන් මුල දී සරවනපෙරුමාල් ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථානයක වැඩ කලේ ය. එහි දී ඔහුට විකොස දෙමල පුවත්පත වන *තොලිලාලර් පාතෙයි* (කම්කරු මාවත) මුනගැසුනු අතර අවසානයේ 1975 දී ඔහු පක්ෂ සාමාජිකයෙක් බවට පත් විය. තමා විකොසට බැඳුනේ ඇයි ද යනුවෙන් විමසූ කල ඔහු පැහැදිලි කලේ තමා සුවිශේෂව ම එහි අංග ලක්ෂන දෙකකට -- දෙමල ජාතිවාදයට එරෙහි අරගලයට සහ විද්‍යා සිසුවකු ලෙස අපෝහක භෞතිකවාදය පිලිබඳ මාක්ස්වාදී දර්ශනවාදයට -- ආකර්ෂනය වූ බව යි.

ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරන්නකු ලෙස වැඩ කලාට අමතරව, සරවනපෙරුමාල් යාපනයේ සිට කිලෝ මීටර් 40ක් පමන දකුනු දෙසින් පරන්තන්හි පිහිටි සිය පවුලේ කුඹුරුවල වැඩ කිරීමට ද පුරුදුව සිටියේ ය. ඔහු විකොසට බැඳීමට ගත් තීන්දුවට මුල දී ඔහුගේ දෙමව්පියන් විරුද්ධ වූ නමුදු, පසුව ඔවුහු පක්ෂයේ ක්‍රියාමාර්ගය අගය කිරීමටත් සිය පුත්‍රයාගේ සහභාගිත්වයට ගරු කිරීමටත් පටන් ගති. පරන්තන්හි ගෙන ගිය සිය වැඩකටයුතු තුලින් එම ප්‍රදේශයේ පක්ෂ ශාඛාවක් ගොඩනැගීමට ඔහු සමත් විය.

1977 දී, සරවනපෙරුමාල්ට කරෙයිනගර් සීනෝර් කම්හලේ විදුලි කාර්මිකයකු ලෙස රැකියාවක් ලැබුනි. මාලු දැල් සහ ෆයිබර්ග්ලාස් බෝට්ටු නිෂ්පාදනය කල මෙම කම්හල උතුරු ශ්‍රී ලංකාවේ සැලකිය යුතු මට්ටමක සේවායෝජකයෙක් විය. සිය රැකියා හා කොන්දේසි ආරක්ෂා කරගැනීමෙහි ලා නායකත්වය පතා සරවනපෙරුමාල් සහ සෙසු විකොස සාමාජිකයන් වෙත හැරුන සීනෝර් කම්කරුවන් අතර විකොස සහ *තොලිලාලර් පාතෙයි* බෙහෙවින් ජනප්‍රිය විය.

එම වර්ෂය දේශපාලන තත්වයේ අර්ථභාරී මාරුවක් සලකුනු කලේ ය. දෙමල පක්ෂවල සන්ධානයක් ලෙස ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුන (ටියූඑල්එෆ්) පිහිටුවන ලද අතර එය දිවයිනේ උතුරේ හා නැගෙනහිර වෙනම දෙමල රාජ්‍යයක් සඳහා ජනවරමක් ලබාගැනීමේ පදනම මත 1977 මහ මැතිවරනයට තරග කලේ ය. එල්ටීටීඊය බවට විකාශනය වූ කන්ඩායම ද ඇතුලත් විවිධ තරුන කන්ඩායම් ටියූඑල්එෆ් සාමාජිකත්වය තුල ක්‍රියාකාරී විය.

සිංහල ස්වෝත්තමවාදය සහ දෙමල ජාතිවාදය යන දෙකට ම එරෙහිව සටන් වැදීමේ ද්විත්ව දේශපාලන කර්තව්‍යයක් විකොසට පැවරුනි. 1977 වර්ෂය තුල දී, සරවනපෙරුමාල් සහ සෙසු විකොස සාමාජිකයෝ ටියූඑල්එෆ් ඉදිරිදර්ශනයට විරුද්ධව දෘඩතර උද්ඝෝෂනයක් සංවිධානය කලහ. සමාජවාදී ඉදිරිදර්ශනයක් මත සිංහල සහ දෙමල කම්කරුවන්ගේ ඒකාබද්ධතාව සඳහා කැඳවුම් කිරීම මත පදනම්ව වඩුකොඩෙයි ආසනයට අපේක්ෂකයකු ඉදිරිපත් කිරීමට පක්ෂය කටයුතු කලේ ය. අවස්ථා කිහිපයක දී ම, ටියූඑල්එෆ් මැරයන්ගේ ප්‍රහාරවලින් සරවනපෙරුමාල් බේරුනේ යන්තමිනි.

දකුනේ දී, විකොස එක්සත් ජාතික පක්ෂයේ (එජාප) ප්‍රතිගාමී පිලිවෙත්වලට එරෙහිව සටන් වැදුනි. බන්ඩාරනායක ආන්ඩුව පරාජය කිරීමෙන් අනතුරුව, ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන නිදහස් වෙලඳ පොල ප්‍රතිව්‍යුහකරන පිලිවෙත් ක්‍රියාශීලීව දිරිගැන්වූ ලෝකයේ මුල් ම නායකයන් අතරට එක් විය. වැඩෙන මහජන වෛරය සහ නොසන්සුන්තාව අපසරනය කරනු පිනිස, ඔහු හිතාමතාම දෙමල විරෝධී ස්වෝත්තමවාදය අවුලුවාලී ය. එය වනාහි 1983 සිවිල් යුද්ධය පිපිරීමට ඍජුව ම තුඩු දුන් පිලිවෙතකි.

සිය කාර්ය බහුල දේශපාලන වැඩකටයුතු මධ්‍යයේ ම, 1978 ජූනි මස සරවනපෙරුමාල් යුග දිවියට ඇතුලත් විය. ඔහුගේ බිරිඳ වූ සරස්වතී පක්ෂ සාමාජිකාවක් බවට පත් නොවුනත්, සරවනපෙරුමාල්ටත් විකොසටත් නිරන්තරයෙන් ම බෙහෙවින් උදව්කාරක විය. ඇය අන් අයට මෙසේ පැහැදිලි කලා යෑ: "මේක අවංක මිනිස්සුන්ගේ පක්ෂයක්. සිදු වන්ට යන්නේ කුමක්ද යන්න පිලිබඳව පැහැදිලි විශ්ලේෂනයක් ඔවුන් සපයනවා." ඔවුන්ගේ නිවස පක්ෂ සාමාජිකයන්ට නිරතුරුව ම විවෘත විය.

## සිවිල් යුද්ධය

සරවනපෙරුමාල්ගේ හා සරස්වතීගේ අත්දැකීම් යුද්ධයෙන් විනාශයට පත් වූ උතුරේ බොහෝ දෙමල ජනයාගේ අත්දැකීම්වලට සම විය. ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා මගින් ඔවුන්ට සලකන ලද්දේ "සතුරන්" ලෙස ය. විකොස එල්ටීටීඊයේ දේශපාලන ඉදිරිදර්ශනයට විරුද්ධ වූ අතර ම, දෙමල විරෝධී වෙනස්කම් කිරීමේ පිලිවෙත ආරක්ෂා කරගැනීමේ වර්ගවාදී යුද්ධයක් ලෙස යුද්ධය හෙලා දැක්කේ ය. උතුරෙන් හා නැගෙනහිරෙන් මිලිටරිය ක්ෂනිකව හා කොන්දේසි විරහිතව ඉවත් කල යුතු යයි පක්ෂය ඉල්ලා සිටියේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස, විකොස සාමාජිකයෝ එල්ටීටීඊය හා හමුදාව යන දෙපාර්ශ්වයේ ම තර්ජනයන්ට හා බියගැන්වීම්වලට ලක් විය.

1987 ජුලි මස, ඉන්දියානු හා ශ්‍රී ලංකා ආන්ඩු, යුද්ධයට දේශපාලන විසඳුමක් සඳහා පදනම සපයන්නේ යැයි අදහස් කෙරුනු ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කලහ. එම ගිවිසුම ඉන්දියානු මිලිටරි "සාමසාධකයන්ට" රටේ උතුරු හා නැගෙනහිර පලාත්වලට ඇතුලු වීමේ අවසරය පැපයී ය. කම්කරු පන්තියේ ආස්ථානයෙන් ගිවිසුමට විරුද්ධ වූ එකම පක්ෂය විකොස යි. ගිවිසුමේ එල්ලය වූයේ දෙමල හා සිංහල යන දෙජාතියට ම අයත් වැඩ කරන ජනයාගේ අරගල මැඩලීම යැයි එය අනතුරු ඇඟවී ය.

එල්ටීටීඊය ගිවිසුමට පිටුබලය දුන් අතර, විකොස එයට එරෙහිව ක්‍රියාශීලීව උද්ඝෝෂනය කරමින් යුද්ධයට තමන්ගේ ම පන්ති විසඳුම සැපයීම සඳහා සටන් වදින ලෙස කම්කරුවන්ගෙන් ඉල්ලා සිටියේ ය. පක්ෂය, ඉන්දියානු උප-මහාද්වීපයේ සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා වූ සිය ඉදිරිදර්ශනයට සටන් වදිනු පිනිස 1987 අගෝස්තුවේ දී යාපනයේ ප්‍රසිද්ධ රැස්වීම් මාලාවක් ම පැවැත්වී ය. සරවනපෙරුමාල් යාපනයේ නල්ලූර් සංස්කෘතික ශාලාවේ පැවති ප්‍රධාන රැස්වීමේ මුලසුන දැරූ අතර එම රැස්වීම ප්‍රාදේශීය දෙමල පුවත්පත්වල ප්‍රමුඛත්වයකින් යුතුව වාර්තා කරන ලදි.

ඉන් යන්තම් දෙමසක් ඇවෑමෙන් විකොස විශ්ලේෂනයේ නිරවද්‍යතාව ඛේදනීය ආකාරයෙන් සනාථ විය. ඉන්දියානු මිලිටරිය එල්ටීටීඊයට එරෙහිව මෘග ප්‍රහාරයක් දියත් කල අතර එහි දී දහස් ගනන් ජනයා ඝාතනයට ලක් විය. උතුරු හා නැගෙනහිර පලාත්වලට ඉන්දියානු හමුදා පැමිනීම මගින් දකුනේ සිංහල මහජනයාට එරෙහිව මුදාහරිනු පිනිස ශ්‍රී ලංකා මිලිටරිය නිදහස් කෙරුනි. ගිවිසුමට එරෙහිව ජවිපෙ ගෙන ගිය ප්‍රචන්ඩ ස්වෝත්තමවාදී ව්‍යාපාරය කඩතුරාවක් ලෙස යොදා ගනිමින්, එජාප ආන්ඩුව ගම්බද දරිද්‍රතාවට ඇද හෙලුනු තරුනයන්ට එරෙහිව 1989 දී රුදුරු මර්දන ව්‍යාපාරයක් දියත් කරනු පිනිස අවස්ථාව ඩැගගති. එම මර්දන ව්‍යාපාරය ජීවිත 60,000ක් පමන බිලිගත්ට ඇතැයි තක්සේරු කෙරේ.

ගිවිසුම බිඳ වැටී 1990 දී ඉන්දියානු හමුදාව ආපසු ගිය අතර රට යලිත් සිවිල් යුද්ධයට ඇද වැටුනි. මිලිටරිය සීනෝර් ආයතනයේ කරෙයිනගර් ශාඛා පරිශ්‍රය වාඩිලා ගත් අතර එය තවමත් නාවික හමුදාවේ පාලනය යටතේ පවතී. සරවනපෙරුමාල්ගේ නිවස ඇතුලු කරෙයිනගර්හි පිහිටි නිවාස සියල්ල ම පාහේ යුද්ධයේ දී විනාශයට පත් විය. එක ප්‍රහාරයක දී යාබද නිවසේ විසූ සරවනපෙරුමාල්ගේ මාමා සහ නැන්දා පිලිස්සීමෙන් ඝාතනයට ලක් විය. අද එම ප්‍රදේශය පඳුරුවලින් හා අකුල්වලින් වැසී පවතී.

මෙම අසීරු කොන්දේසි නොතකා, සරවනපෙරුමාල් සහ සීනෝර්හි ම වැඩ කල එස්. චන්ද්‍රසේකරන් රැකියා ආරක්ෂා කරගැනීම පිනිස වැදගත් දේශපාලන අරගලයක් ගෙන ගියහ. ශ්‍රම බලකාය 800 සිට 100 දක්වා කප්පාදු කිරීමෙන් පසුව, 1991 දී, සීනෝර් කලමනාකරනය, ඒ වන විට ක්‍රියාත්මක වෙමින් තිබූ සිය ගුරුනගර් ශාඛාව ඇතුලුව යාපන අර්ධද්වීපය පුරා පිහිටි සමාගමේ සියලුම අංශ වසා දමන බව නිවේදනය කලේ ය. ලංකා වෙලඳ, කාර්මික හා පොදු කම්කරු සංගමය (සීඑම්යූ) සහ ලංකා ඉංජිනේරු කම්කරු සංගමය ආන්ඩුවේ සැලසුමට ද එහි "ස්වේච්ඡාවෙන්" විශ්‍රාම ගැන්වීමේ වැඩපිලිවෙලට ද සහාය දුනි.

සීනෝර් සීඑම්යූ ශාඛාවේ තනතුරු දැරූ සරවනපෙරුමාල් සහ චන්ද්‍රසේකරන් සෙසු කම්කරුවන් 24 දෙනා සමග එක්ව එම සැලසුමට විරුද්ධ විය. ඔවුන්ගේ උද්ඝෝෂනය කලමනාකරනයට පමනක් නොව බාලා තම්පෝගේ නායකත්වයෙන් යුත් සීඑම්යූ නිලධරයටත් එරෙහි අරගලයක් විය. ලසසපයේ හිටපු නායකයකු වූ තම්පෝ, 1964 ලසසප පාවාදීමට විරුද්ධ වූ නමුදු, එහි ගැඹුරු දේශපාලන මූලයන් පරීක්ෂා කිරීමෙහි ලා අපොහොසත් විය. ඔහු ස්වකීය අවස්ථාවාදී දේශපාලනය ආවරනය කරගනු වස්, සටන්කාමී පූච්චානම් ද සමිතිය තුල දේශපාලන විවාද සඳහා යොමු වන ඕනෑම අයකුට, විශේෂයෙන් ම අව්‍යාජ සමාජවාදීන්ට, එරෙහි හෙලාදැකීම් ද යොදා ගති.

සරවනපෙරුමාල් සහ චන්ද්‍රසේකරන් විසින් සංවිධානය කරන ලද සීනෝර් ශාඛාවේ නියෝජිත කන්ඩායමක් කොලඹ පැමින සීඑම්යූ නායකත්වය ප්‍රතිමුඛ කොට සිය රැකියා ආරක්ෂා කිරීමට සමිතිය ක්‍රියා කල යුතු යැයි ඉල්ලා සිටියේ ය. එම අවස්ථාව මෙම කම්කරුවන් සඳහා කටුක පාඩමක් විය. සීඑම්යූ නායකත්වය රැකියා සඳහා අරගල කිරීම ප්‍රතික්ෂේප කලා පමනක් නොව, වැඩෙමින් පැවති අරගලයට වලකැපීමේ එල්ලයෙන් යුත් ගනුදෙනුවකට කලමනාකරනය සමග සහයෝගී විය. කම්කරුවන් 26 දෙනා දොට්ට දැමීමේ ප්‍රයත්නය අසාර්ථක වූ තතු තුල, කලමනාකරනය

කලේ, සීඑම්යූ නායකයන්ගේ ආශිර්වාදය ද ඇතිව ඔවුන් අඩ වැටුප් මට්ටමේ වැඩ නැති තත්වයේ තැබීම යි.

චන්ද්‍රිකා කුමාරතුංග 1994 දී සාමය උදා කරන බවට පොරොන්දු වෙමින් ජනාධිපතිවරනයෙන් ජය ලැබී ය. එහෙත් 1995 දී කුමාරතුංගගේ පොදු පෙරමුනු ආන්ඩුව එල්ටීටීඊය සමග සාකච්ඡා බිඳ වැටීමෙන් පසුව යුද්ධය උත්සන්න කලේ ය. දැවැන්ත මිලිටරි ආක්‍රමනයක් මධ්‍යයේ, සරවනපෙරුමාල්ට සහ සෙසු විකොස සාමාජිකයන්ට, තවත් දස දහස් සංඛ්‍යාත ජනයා සමග, යාපනයෙන් පලා යාමට බල කෙරුනි. ඔහු සහ ඔහුගේ පවුල, 1998 දී යාපනයට පෙරලා පැමිනීමට පෙරාතුව, පරන්තන් සහ කිලිනොච්චිය ඇතුලු ප්‍රදේශ ගනනාවක ඉතා අසීරු කොන්දේසි යටතේ සරනගතයන් ලෙස ජීවත් විය.

1998 ජුලි මාසයේ දී, එල්ටීටීඊයේ පාලනය යටතේ තිබූ ප්‍රදේශයක් වන කිලිනොච්චියේ දී, පක්ෂයේ සමාජවාදී ඉදිරිදර්ශනයට උද්ඝෝෂනය කිරීම හේතු කොට ගෙන සසප සාමාජිකයන් සිවු දෙනෙක් එල්ටීටීඊය විසින් අත් අඩංගුවට ගන්නා ලදි. සරවනපෙරුමාල් අත් අඩංගුවට ලක් වීමෙන් ගැලවුනේ, වවුනියාවේ රෝහලෙන් වෛද්‍ය ප්‍රතිකාර ගැනීම පිනිස, කිලිනොච්චියේ සිට කිලෝමීටර් 70ක් පමන දකුනෙන් ආන්ඩුවේ පාලන ප්‍රදේශය තුල පිහිටි වවුනියාවට ගොස් තිබීම හේතු කොට ගෙන ම පමනි. සිය සහෝදරවරුන් රඳවාගැනීම පිලිබඳ පුවත දැනගැනීමෙන් කෝපාවිෂ්ඨ වූ ඔහු 1998 සැප්තැම්බරයේ දී අවසානයේ සසප සාමාජිකයන් නිදහස් කරගැනීම සහතික කරගත් සසප සහ ලෝක සමාජවාදී වෙබ් අඩවිය ගෙනගිය ජාත්‍යන්තර උද්ඝෝෂනයට ක්‍රියාශීලීව සහභාගි විය.

සීනෝර්හි රැකියා රැකගැනීම සහ ආයතනය යලි විවෘත කරගැනීම සඳහා ගෙනගිය උද්ඝෝෂනය මධ්‍යයේ, 1999 දී ආන්ඩුව සමාගමේ ගුරුනගර් ශාඛාව යලි විවෘත කිරීමට තීන්දු කලේ ය. 2000 දී යලි සේවයට බඳවා ගැනුනු ප්‍රථමයා වූයේ සරවනපෙරුමාල් ය. විදුලි කාර්මිකයකු ලෙස, ඔහු එහි යන්ත්‍රෝපකරන අලුත්වැඩියාව සඳහා අවශ්‍ය විය. විකොස ගෙන ගොස් තිබූ උද්ඝෝෂනය හේතු කොටගෙන ඔහු සීඑම්යූ ශාඛා ලේකම් ලෙස තේර් පත් වූ අතර සිය මරනය දක්වා ම එම තනතුරේ සිටියේ ය.

සරවනපෙරුමාල් ඔහුගේ දේශපාලන ධෛර්‍යය හේතු කොටගෙන පමනක් නොව, විදුලි කාර්මිකයකු ලෙස ඔහු දැක්වූ නිපුනතාව නිසා ද යාපන අර්ධද්වීපය පුරා කීර්තියට පත් විය. 1990 ගනන් මුල දී, දකුනේ ගාලු වරායේ නැංගුරම් ලා තිබූ විදේශ නෞකාවක මූලික විදුලි උපකරනයක් අලුත්වැඩියා කරනු පිනිස ඔහු කැඳවන ලදි. එහි දී ඔහුට උපාංග විදුලි කාර්මික ශ්‍රේනිය ප්‍රදානය කෙරුනි. සීනෝර් වැඩපලේ යන්ත්‍රෝපකරන යලි පන ලැබුවේ ඔහුගේ දැනුම සහ හැකියාවන් හරහා ය.

සරවනපෙරුමාල් සරල ජීවිතයක් ගත කල අතර ත්‍යාගශීලී පුද්ගලයකු ලෙස ද ප්‍රසිද්ධියක් ඉසිලී ය. සිය මාසික වැටුප අතට ගැනීමෙන් පසුව, නිවස බලා යන අතරමග දී හමුවන දන්නා හඳුනන දුප්පතුනට මුදලින් ආධාර කිරීමට ඔහු නිරතුරුව ම පුරුදුව සිටි බව සමාජවාදී සමානතා පක්ෂයේ සාමාජිකයෝ මතක් කලහ. කරෙයිනගර්හි පිහිටි ඔහුගේ නිවස විනාශ වූ බැවින් ඔහු සිය පවුල සමග ජීවත් වූයේ යාපනයේ කුලී නිවසක ය.

පසුගිය ඔක්තෝබරයේ දී, සසපයේ සහෝදර පක්ෂයේ එක්සත් ජනපද ජනාධිපති අපේක්ෂක බිල් වැන් ඕකන් ආමන්ත්‍රනය කල ප්‍රසිද්ධ රැස්වීමට සහභාගි වනු පිනිස සරවනපෙරුමාල් යාපනයේ සෙසු සසප සාමාජිකයන් සමග කොලඹට පැමිනියේ ය. එම රැස්වීම සරවනපෙරුමාල් මත විශාල බලපෑමක් ඇති කලේ ය. ඔහු උද්යෝගිමත්ව සෙසු සහෝදරවරුන්ට පැහැදිලි කලේ, ඇමරිකානු හා ශ්‍රී ලාංකික කම්කරුවන් මුහුන දෙන පොදු ගැටලු ද එක්සත් ජනපදය තුල දේශපාලන තත්වය ද අවබෝධ කරගැනීමෙහි ලා වැන්ගේ දේශනය තමන්ට උදව්කාරක වූ බවයි.

පෙබරවාරියේ දී පැවති ඔහු සහභාගි වූ අවසන් සසප ශාඛා රැස්වීමේ දී සරවනපෙරුමාල් 1971 දී බ්‍රෙට්න්වුඩ්ස් සම්මුතිය බිඳවැටීම ගැන වාර්තාවක් ඉදිරිපත් කලේ ය. එම බිඳවැටීම වනාහි පශ්චාත් යුදකාලීන සමථයන් බිඳවැටීමේත් එක්සත් ජනපද මිලිටරිවාදය පැනනැගීමේත් ආරම්භය සලකුනු කල සිද්ධියකි. ඔහු සාමාන්‍යයෙන් පක්ෂ රැස්වීම්වල දී දීර්ඝ ප්‍රතිපදානයන් සිදු නොකල නමුත් දේශපාලන මූලධර්ම සම්බන්ධයෙන් ඔහුට පැවති ඇති දෘඪ අවබෝධය මත පාදකව නවක සාමාජිකයන් හා ආධාරකරුවන් ඉවසිලිවන්තව උගන්වාගැනීමට නිරතුරුව ම ප්‍රයත්න දැරී ය. පක්ෂ සාමාජිකයන්ට මෙන් ම, ඔහුට ප්‍රගාඪ ආනුභාවයක් තිබූ සිය පවුලේ සාමාජිකයන්, මිතුරන් සහ සහෝදර කම්කරුවන්ගේ පුලුල් කවයන්ට ද ඔහු නැති අඩුව දැනෙනු ඇත.

සිය ජීවිතය පක්ෂ උරුමයේ අත්‍යවශ්‍ය කොටසක් බවට පත් කල මෙම ධෛර්‍යමත් ට්‍රොට්ස්කිවාදී සටන්කරුවාට සසප සිය උපහාරය පුදකර සිටී.

© www.wsws.org